# දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්නය

මෙරට දෙමළ ජනයාට ඇති ප්‍රශ්නය කුමක් ද යන්න නැවතත් සාකච්ඡා කළ යුතු යැයි සිතමි. න්‍යායානුකූලව, සංකල්පීය ව සිතීමට නොහැකි ඇතැම් පඬියන් ප්‍රශ්නය කුමක් ද යන්න අපෙන් ඇසීමට ඉදිරිපත්වන්නේ අප දැන් ප්‍රශ්නයක් ඇතැයි කියන්නේ යැයි උපකල්පනය කරමිනි. තර්කණයෙහි හෝ වෙනත් කිසිවක හෝ කිසිම සංගත බවක් නොමැති මේ පඬියෝ අවුරුදු දහයෙන් දහයට පමණ මෙන් ඉන්දියාව සම්බන්ධයෙන් ඇති තම මතය වෙනස් කර ගනිති. ඉන්දියානු පක්ෂපාතීත්වයේ සිට ඉන්දියානු විරෝධය දක්වා මාරුවීමට ඔවුන්ට අවශ්‍යවන්නේ දේශපාලන අවස්ථාවාදය පමණකි.

දෙමළ ජනයාට දෙමළ නිසා ම පමණක් වූ අසාධාරණයක් නැත. දෙමළ ජනයාට දෙමළ වූ නිසාම පමණක් සිදු වී ඇති අසාධාරණය කුමක් ද යන ප්‍රශ්නයට අදත් පිළිතුරු නැත. මෙවැනි ප්‍රශ්නයක් අප විසින් අසනු ලැබ ඇති බව මෙතෙක් අමතක කර තිබූ කුහකයෝ හදිසියේ ඒ ප්‍රශ්නය අපට මතක් කර දෙති. අද බාලයෝ කුහකයන්ට ඩැෂ් ප්‍රහාර එල්ලකිරීමට බෝලය ඔසවා දෙති. සමහර ව්‍යාජ උගතුන් සිතා සිටින්නේ 1958, 1977, 1983 ආදී වසරවල සිදුවූ ඇතැම් සිද්ධි ඒ සඳහා උදාහරණ බව ය. එහෙත් එවැනිම දෑ සිංහලයන්ට ද සිදු වී ඇති බව අමතක නොකළ යුතු ය. එසේ වුවත් ඒ කරුණ නිසා මෙරට දෙමළ ජාතිවාදයක් ඇතැයි අපි නො කියමු. එහෙත් මෙරට දෙමළ ජාතිවාදයක් ඇත. එහි ප්‍රභවය වෙනත් එකකි. මෙරට ඇති ප්‍රශ්නය ද අන් කිසිවක් නොව දෙමළ ජාතිවාදය ය. මේ බව අප කිහිප වතාවක් ම කියා ඇති නමුත් ඒ නැවතත් කීමෙහි වරදක් නැත.

මෙරට ස්ථිරවාසී දෙමළ ජනයාගේ ඉතිහාසය ලන්දේසි යුගයෙන් ඈතට නොයයි. ඉන් පෙර මෙරටට සංක්‍රමණය වූ දෙමළ ජනයා එක්කෝ පරම්පරා දෙකක් යෑමට පෙර සිංහල වූහ. නොඑසේ නම් ආපසු භාරතයට ගියහ. අද යාපනයේ සිටින දෙමළ ජනයාට අඩුතරමින් ආර්ය චක්‍රවර්තී රාජ්‍යය සමගවත් සම්බන්ධ නැත. ආර්ය චක්‍රවර්ති නම් පාලකයන් දෙමළ නොවන බව ආර්ය යන වචනය යොදාගැනීමෙන් ම පැහැදිලි වෙයි. එහෙත් අපි දෙමළ ජාතිවාදීන් මෙන් පාලකයකුගේ ජනවර්ගය අනුව රාජ්‍යයක් හැඳින්වීමේ අමනෝඥ පිළිවෙත අනුගමනය නොකරමු. දෙමළ ජාතිවාදීන් වඩිග රජවරුන් කල පැවති කන්ද උඩරට රාජ්‍යය දෙමළ යැයි හඳුන්වන්නේ පාලකයන්ගේ වඩිගබව බලා ය. එය කරුණු දෙකක් නිසා වැරදි ය.පළමුවෙන් වඩිගයෝ දෙමළ නො වූහ. ඔවුන් ලංකාවට පැමිණියේ මදුරෙයි පුර සිට වුව ද ඔවුන් ඒ ප්‍රදේශයට පැමිණ ඇත්තේ ආන්ද්‍ර ප්‍රදේශයෙන් ය. ආන්ද්‍රයේ බස තෙළිඟු ය. ඒ බසට සිංහලයන් කීවේ ආන්ද්‍ර දෙමළ හෙවත් අන්ධර දෙමළ කියා ය. අපේ වැටහීම අනුව ආන්ද්‍රයෝ ද්‍රවිඩ නොවූහ. ඔවුහු පසුකලක දෙමළ ආභාසය යටතෙහි ද්‍රවිඩ බවක් අත්කරගත් පැරණි භාරතීය ජනකොටසක් වූහ. ආර්යයන් (වෛදිකයන් - බමුණන්) මෙන් ම ද්‍රවිඩයන් ද භාරතයට පැමිණ ඇත්තේ පිටින් ය. මේ දෙකොටස ම භාරතයට පැමිණීමට පෙර එහි විසූවන් අපි මෙතෙක්කල් අනාර්ය ලෙස ද හැඳින්වීමු. අනාර්ය යන්නෙන් ආර්ය හෝ ද්‍රවිඩ හෝ නොවන බව කීම අපේ අරමුණ වුවත් එහි ආනාර්ය යන්න උපයෝගී කරගනිමින් ඇතැමුන් එයට ද්‍රවිඩ යන අර්ථකථනය දීමට ඉඩ ඇති බැවින් මින් මතු ඔවුන් ප්‍රාග් වෛදිකයන් යන නමින් පමණක් හඳුන්වමු.

සිදුහත් කුමරු අයත්වන්නේ ප්‍රාග් වෛදික ගෞතම ගෝත්‍රයට හා ශාක්‍ය වංශයට ය. එතුමා සිද්ධාර්ථ ගෞතම කුමරු විය. අදත් ඉන්දියාවේ ගෞතමලා සිටිති. මොහෙන්ජදාරෝ හා හරප්පා ඊනියා ද්‍රවිඩ රාජ්‍යය නොව ප්‍රාග් වෛදික රාජ්‍ය විය. ද්‍රවිඩයන් බටහිර ආසියාව පැත්තෙන් භාරතයට පැමිණ ඇත්තේ වෛදිකයන් එහි පැමිණ සියවස් ගණනාවකට පසුව ක්‍රිස්තු පූර්ව හයවැනි හත්වැනි සියවස්වල ය. ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ අප අර්ධ වෛදිකයන් ලෙස හඳුන්වන විජයගෙන් සංකේතවත් වන පිරිසක් ක්‍රිස්තු පූර්ව නවවැනි සියවසේ කළිඟු (කාලිංග) හා වංග (බෙංගාල) ප්‍රදේශවලින් ලංකාවට පැමිණීමටත් පසුව බව ආචාර්ය ශිරාන් දැරණියගල මහතා විසින් අනුරාධපුරයේ කරන ලද කැණීම්වලින් තහවුරු වෙයි. ලංකාවට පැමිණි මේ පිරිස මෙරට විසූ ප්‍රාග් වෛදික ජනතාව සමග සියවස් පහක හයක පමණ කාලයක් තිස්සේ කරන ලද සටන්, කරගන්නා ලද ආවාහ විවාහ, ඔස්සේ ඒ ජනතාව සමග මිශ්‍ර වී අවසන පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය පිහිටුවා ගෙන ඇත.

කන්ද උඩරට රාජ්‍යය දෙමළ ලෙස හැඳින්වීමට පොරකන දෙමළ ජාතිවාදීහු හා ඔවුන්ගේ හා බටහිරයන්ගේ අන්තේවාසිකයන් වූ සිංහලෙන් පත්තර කඩමාළුවලට හා එවැනි සඟරාවලට ලියන පඬියෝ ඉංගිරිසි රාජ්‍යය ජර්මන්

© Prof. Nalin De Silva

හෝ ග්‍රීක හෝ වෙනත් යමක් ලෙස නො හඳුන්වති. එංගලන්තයේ රජකරන්නවුන්ගේ සම්භවය ජර්මන් ග්‍රීක ආදී වෙයි. ඉංගිරිසි ජනයා වත්මන් එංගලන්තය ආරම්භවී යැයි සලකන්නේ එකළොස්වැනි සියවසේ ය (1066) . එකල එහි පැමිණි නෝමන්වරු වත්මන් ඉංගිරිසි රාජ්‍යය ආරම්භ කළහ. එහි දී හේස්ටිංග්ස් සටන නමින් හැඳින්වෙන සටන වැදගත් වෙයි. මේ ඉතිහාසය අප පාසල් ගිය අවධියේත් පාසලේ උගන්වනු ලැබිණි. නෝමන්වරු එංගලන්තයට ගියේ ප්‍රංශයේ ප්‍රදේශයකින් ය. ඔවුන් කතාකෙළේ ප්‍රංශ භාෂාව ය. අදත් ඉංගිරිසි රාජ්‍යයේ ඇතැම් පාඨ ඇත්තේ ප්‍රංශ භාෂාවෙන් ය. එසේ වුවත් ඉංගිරිසි රාජ්‍යය ඉංගිරිසි ලෙස මිස ප්‍රංශ, ජර්මන් හෝ ග්‍රීක (එඩිංග්බරා ආදිපාද තැනගේ සම්භවය ග්‍රීක වෙයි. එවිට චාල්ස් වින්ඩ්සර්ගේ සම්භවය ග්‍රීක ජර්මන් වෙයි.) ලෙස හඳුන්වන්නකු නැත. ඩයනා ස්පෙන්සර් ඉංගිරිසිවීම නිසා කලකට පසු ඉංගිරිසි රජවරුන්ට (ඩයනාගේ පුතුන්ට) ඉංගිරිසි සම්භවයක් ගැන කතාකිරීමට හැකිවනු ඇත. රජවරුන්ගේ සම්භවය කුමක් වුවත් ඉංගිරිසි ජනයා ඇංග්ලෝ සැක්සන් වෙති. සාමාන්‍ය ජනයා මෙන් ම රජවරු ද ඉංගිරිසිකරණයට ලක් වී ඇත. එහෙත් පඬියන්ට කන්ද උඩරට රාජ්‍යය සිංහල නො වෙයි. සපුමල් කුමරු ආදීහු සිංහල නො වෙති. ඔවුහු සිංහලයන් සම්බන්ධයෙන් හත්කල ඊනියා සම්භවයක එල්ලී සිටිති.

සිංහලයන් පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය හා සිංහල රාජ්‍යය පිහිටුවාගත් නමුත් දෙමල ජනයාට ලෝක ඉතිහාසයේ කෙදිනකවත් කොතැනකවත් දෙමළ ජාතියක් හෝ දෙමළ රාජ්‍යයක් හෝ ගොඩනගාගැනීමට නොහැකි වී ඇත. දෙමළ ජනයා භාරතයේ දී වුව ද දෙමළ ජනවර්ගයෙන් ඔබ්බට නොගියහ. සොළී පාණ්ඩ්‍ය චේර පල්ලව (ඒ ද්‍රවිඩ යැයි සැලකුව ද) ආදී රාජ්‍ය තිබුණ ද ඒ එකක්වත් දෙමළ රාජ්‍යයක් නො වී ය. ලංකාවේ යාපනය ප්‍රදේශයේ අද ජීවත්වන දෙමළ ජනයාගෙන් බහුතරය ලන්දේසීන් විසින් කෝරමණ්ඩල වෙරළින් දුම්කොළ වගාව සඳහා ගෙන්වනු ලැබූ ජනයාගෙන් පැවතෙන්නෝ වෙති. ඉතිරි අය එවකටත් එහි සිටි සිංහලයන්ගෙන් හා වේලක්කාර භටයන්ගෙන් (මලයාලම්) පැවතෙන්නෝ වෙති. අප ඉදිරිපත්කරන මේ මතයෙන් යාපනයේ කතාකරන දෙමළ පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඇතිවෙයි. අද යාපනයේ කතාකරන දෙමළ තමිල්නාඩුවේ කතාකරන දෙමළ බසින් එතරම් වෙනස් නො වෙයි. අනෙක් අතට යාපනයේ දෙමළ බසෙහි තමිල්නාඩු දෙමළ බසට වඩා මලයාලම් වචන වෙයි. එසේ වීමට හේතුව යම් වේලක්කාර ප්‍රභවයක් යාපනයේ වීම ය. අප ඉදිරිපත්කරන මතය ඕනෑම වාග්විද්‍යාඥයකුට පරීක්ෂණයක් මගින් ඛණ්ඩණය කළ හැකි ය. වාග්විද්‍යාඥයකු කළ යුත්තේ යාපනයේ කතාකරන දෙමළ හා තමිල්නාඩුවේ කතාකරන දෙමළ අතර වයස් පරතරය සෙවීම පමණ ය. ඒ වයස් පරතරය අවුරුදු තුන්සිය පණහකට වැඩි නම් අපේ මතය අනාථ වෙයි. කිසිම වාග්විද්‍යාඥයකු මේ අභියෝගය භාර නොගන්නේ ඇයි?

ඉතිහාසය ඉගෙනීමේ දී ද එවැනි පරීක්ෂණයට ලක්කළ හැකි මතවලට ද වැදගත්කමක් ලබාදිය යුතු ය. අපට අවශ්‍ය වන්නේ අනෙක් සාධක හා ප්‍රවාද සමග සංගත වූ ප්‍රවාද පද්ධතියක් ඉතිහාසය සම්බන්ධයෙන් ද ඉදිරිපත්කිරීම ය. අද මෙරට දෙමළ ජනයාගේ ඉතිහාසය අවුරුදු දහස් ගණනක් ඈතට ගෙනයන්නේ හුදෙක් විවරණ පදනම් කරගනිමිනි. එළාර සොළී යැයි කී පමණින් එකළ ලංකාවේ දෙමළ ස්ථිර පදිංචිකරුවන් සිටියේ යැයි කිව හැකි නො වෙයි. අනෙක් අතට එළාර සොළී වී ද යන්න ද ප්‍රශ්නයකි. ඇතැමුන්ට අනුව එළාරට ඇත්තේ පර්සියන් සම්භවයකි. ඒ කෙසේ වෙතත් එකළ සිට මෙරට දෙමළ ජනයා ස්ථිරව පදිංචි ව සිටියේ නම් භාෂාවේ විකාශය ඔස්සේ මෙරට ජනයා කතාකරන දෙමළ හා තමිල්නාඩුවේ දෙමළ අතර අවුරුදු දෙදහසක පමණ පරතරයක් තිබිය යුතු ය. හුදෙක් විවරණ හා යාල්පානම් වෛපව මාලෙ වැනි ව්‍යාජ ඉතිහාස ග්‍රන්ථ මත පදනම් නොවී වාග්විද්‍යාව මත පදනම් වී අපට මේ වැදගත් ප්‍රශ්නය සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබාගත හැකි ය. යාල්පානම් වෛපව මාලෙ කෘතිය සිංහල රජවරුන්ට නැගෙනහිර වෙරළ අහිමිකිරීමේ චේතනාවෙන් යාපනයේ ලන්දේසි ආණ්ඩුකාරයා දෙමළ මුදලිවරයකු ලවා ලියවන ලද බොරු මාලයකි. යාපනය දෙමළ ජනයාගේ ආරම්භය ලන්දේසින් නිසා සිදු වී නම් නැගෙනහිර දෙමළ ජනයාගේ ආරම්භය ඉංගිරිසින් නිසා සිදු වුවකි. කම්කරුවන් ලෙස විවිධ වැඩකිරීම සඳහා ඉංගිරිසින් දකුණු ඉන්දියාවෙන් ගෙන් වූ පිරිස් නැගෙනහිර පළාතේ පදිංචිකරවනු ලැබූහ. යාපනයේ දෙමළ ජනයා ගොවීහු වූහ. ඔවුහු ප්‍රධාන වශයෙන් වෙල්ලාලයෝ වූහ. මඩකලපුවේ ජනයාට එතරම් කුලීන බවක් නැත. මේ දෙපිරිස අතර කුල වශයෙන් ඇති වෙනසට ද ප්‍රධාන හේතුව මේ සම්භව වෙනස ය. උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමට අවශ්‍ය වූයේ ඊනියා කුලීන යාපන වැසියන් පිරිසකට මිස නැගෙනහිර දෙමළ ජනයාට නො වේ. (මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva